**ජන සංගණනය 2025 වසර**

# සංගණනයට අදාළ සමීක්ෂණ පත්‍රිකාව සම්පූර්ණ කරන ආකාරය

සංඛ්‍යාලේඛන කාර්යාංශය, ප්‍රවෘත්ති හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

**මෙම පත්‍රිකාව ජන සංගණනයේ අරමුණු පැහැදිලි කරන අතරම, සංගණනයට අදාළ සමීක්ෂණ පත්‍රිකාව සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස්ද සපයනු ලබයි. මෙහි පිටු අංක 2 සිට 8 දක්වා සමීක්ෂණ පත්‍රිකාව පිරවීම පිළිබඳව සිංහල භාෂාවෙන් ලබා දී ඇති උපදෙස් උපයෝගී කරගෙන, <u>ජපන් භාෂාවෙන් ලබා දී ඇති සමීක්ෂණ පත්‍රිකාව</u> සම්පූර්ණ කරන්න.**

**ජපන් භාෂා සමීක්ෂණ පත්‍රිකාව තුනට නවා ලියුම් කවරයට ඇතුල්කර මුද්දර නොඅලවා ඔක්තෝබර් මස 8 වන දිනට (බදාදා) පෙර ළඟම ඇති තැපැල් පෙට්ටියට දමන්න.**
**නියමිත කාලසීමාව තුල සංගණන පත්‍රිකාව භාරදිය නොහැකි වුනි නම්, පසු දිනකදී සමීක්ෂණ නිලධාරියා පැමිණ භාරගනු ඇත.**

**පිළිතුරු වල අන්තර්ගතය, සංඛ්‍යාලේඛන ජනනය කිරීමට පමණක් භාවිතා කෙරෙන අතර, ආගමන විගමන පාලනය හෝ පොලිස් පරීක්ෂණ වැනි වෙනත් අරමුණු සඳහා භාවිතා නොවේ.**

## සංගණනය පිළිබඳව

2025-10-1 දින ජපානය පුරා එකවර මෙම සංගණනය පැවැත්වේ.
මෙම සංගණනය සංඛ්‍යාලේඛන නීතියට අනුව ජපන් රජය විසින් පවත්වනු ලබන ඉතාම වැදගත් සංඛ්‍යාන සමීක්ෂණය වන අතර, ජපානයේ ජීවත්වන සියලු දෙනා ඔවුන් කුමන ජාතියකට අයත් වුවත් මෙම සමීක්ෂණයට පිළිතුරැ සැපයීමට බැඳී සිටී.
නීතිප්‍රකාරව සංගණයට භාජනයවන හැමකෙනෙකුම සංගණන පත්‍රිකාව පුරවා භාරදිය යුතුය.
තවද, සංගණනයට සම්බන්ධ වන අය සමීක්ෂණ නිලධාරියා ඇතුලුව රහස්‍යභාවය රැකීමට නීතියෙන් බැඳීසිටී.
සම්පූර්ණ කර ආපසු ලැබෙන සමීක්ෂණ පත්‍රිකා, තොරතුරු පිටතට යානොදී දැඩි පාලනයක් යටතේ තබාගනු ලබන අතර, දත්ත ලබාගැනීමෙන් පසු ඒවා විනාශකර හරිනු ලැබේ.
මෙම සංගණනයේ ප්‍රතිඵල විදේශිකයන් ඇතුලු ජපානයේ වෙසෙන සියලූ වැසියන්ගේ සුභ සිද්ධිය සඳහාවන ප්‍රතිපත්ති නිර්මාණය කිරීමෙහිලා අවශ්‍ය මූලික දත්ත සපයනු ලබයි.

## සෑම ගෘහ ඒකකයක් විසින්ම මෙම සමීක්ෂණ පත්‍රිකා සම්පූර්ණ කල යුතුය.

◆ ගෘහ ඒකකයක් ලෙස සැලකෙන්නේ එහි වියදම් බෙදාහදා ගනිමින් නිවසක එකට ජීවත්වන පිරිසකි.
◆ එක් අයෙකු එක් නිවාස ඒකකයක තනිව වාසය කරයි නම්, එය එක් අයෙකුගෙන් සමන්විත ගෘහ ඒකකයක් ලෙස සැලකේ.

● පහත සඳහන් පුද්ගලයන්ගේ ගෘහ ඒකකයන් වර්ගීකරණය කරනු ලබන්නේ මෙහි දක්වා ඇති ආකාරයටයි.


○ නවාතැන්ගෙන සිටින පුද්ගලයෙකු (රූම් ශෙයා ද අයත් වේ) ............ තනිව ජීවත්වන අයෙකු වුවද සහෝදර සහෝදරියන් ආදී පවුලේ සාමාජිකයින් සමග ජීවත්වන පිරිසක් වුවද එක් ගෘහ ඒකකයක් ලෙස සැලකේ.

○ රැකිරක්ෂා කරමින් තනිව ජීවත්වන පුද්ගලයෙකු ............ එවැනි අයෙකු තම ස්වාමියාගේ නිවසෙහිම ජීවත් වන්නේ නම් ඔහු හෝ ඇය තම ස්වාමියාගේ ගෘහයට ඇතුළත් කළ යුතුය. එවැනි අයෙක වෙන්වූ ගොඩනැගිල්ලක ජීවත් වන්නේ නම් එය වෙනම ගෘහයක් ලෙස සැලිකිය යුතුය.

○ රජය, සංස්ථාවක් හෝ සමාගමක් විසින් සපයන ලද නේවාසිකාගාරයක ජීවත්වන අවිවාහක පුද්ගලයෙකු ........... එක් ගෘහ ඒකකයක් ලෙස සැලකිය යුතුය.

## සංගණන පත්‍රිකාව පුරවා සම්පූර්ණ කරන ආකාරය

- කරුණාකර මෙය සම්පූරණ කිරීමට කලු පැන්සලක් හෝ යාන්ත්‍රික පැන්සලක් භාවිතා කරන්න.
- ඕවල් හැඩයෙන් යුතු සලකුණ මෙහි දක්වා ඇති ආකාරයට සම්පූර්ණයෙන් පාට කරන්න. ⬭ → ⬬
- කොටුවලින් පිටත නොලිවිය යුතු අතර, දකුණුපස පිරෙන ලෙස ලිවිය යුතුය.




## සංගණන පත්‍රිකාවේ මුල් පිටුව සම්පූර්ණ කරන ආකාරය

### ගෘහය පිළිබඳව

**1 ගෘහයේ වර්ගය**

"වෙනත්" යන ගෘහ වර්ගය සඳහා, නිවසක් නොමැති අය හෝ සරල නවාතැන්පලවල හෝ ඉදිකිරීම් සේවක නිවාසවල තනිව ජීවත් වන පුද්ගලයින් ආදිය අයත් වේ.

**2 ගෘහයේ සිටින පුද්ගලයින් ගණන**

ඔබගේ ගෘහයෙ හි සිටින සාමාජිකයින් ගණන 5 ක් හෝ ඊට වැඩිනම්, සමීක්ෂණ පත්‍රිකාවේ පළමු පිටුවෙහි සාමාජිකයිනගේ මුළු ගණන සඳහන් කරන්න.

**3 වාසය කරන නිවසේ වර්ගය**

**තමාටම අයත් නිවසක ...................** තමාටම අයත් නිවස මෙතෙක් ලියාපදිංචිකර නොමැති හෝ, නිවාස ණය සම්පූර්ණයෙන් ගෙවා නිමකර නොමැති වුවද, ඒවාද මෙයට ඇතුලත් වේ.

**නගර ප්‍රතිසංස්කරණ සංවිධානයේ (UR) පොදු නිවාස සංකීර්ණයක ...............** නාගරික ප්‍රතිසංස්කරණ සංවිධානයට, දිස්ත්‍රික්කයට හෝ නගරයට/ ග්‍රාමයට අයත් රාජ්‍ය සංස්ථාවලට, නිවාස සංගම්වලට, නගර නවීකරණ කාර්යාංශ වලට අයත් නිවාස, කෙසේ වෙතත්, "සමාගම් හා රාජ්‍ය සේවක නිවාස" මෙයට ඇතුලත් නොවේ.

**සමාගම් හා රාජ්‍ය සේවක නිවාස .....** සමාගමක, රාජ්‍ය ආයතනයක හෝ වෙනත් ස්ථානයක කුලියට ගන්නා ලද, සේවකයින් සඳහා වූ නිවසක්

**අන් අයගේ නිවසක කොටසක .........** වෙනත් අය ජීවත්වන නිවසක කොටසක් ඔබ කුලියට ගන්නා විට. කෙසේ වෙතත් කුලියට ගෙන සිටින කොටස පහත ① හා ② යන දෙකටම අයත් වේනම් "පෞද්ගලික කුලී නිවාස" ඝනයට අයත් වේ.

**සමාගම් ආදියේ තනි පුද්ගලයින් සඳහා වන නේවාසිකාගාර, වෙනත් නිදන ශාලාවක .................** සමාගම්, ජන සංගම් හෝ රාජ්‍ය සංවිධාන මගින් තනි සේවකයින් සඳහා කුලියට ගත් ගොඩනැගිලි, කෙසේවෙතත්, වාසස්ථාන කොටස පහත ① හා ② යන දෙකටම අයත්වේ නම්

එය “සමාගම් හා රාජ්‍ය සේවක නිවාස” ඝනයට අයත් වේ.

① වෙනත් ගෘහයන්ගෙන් සම්පූර්ණයෙන්ම වෙන්ව ඇතිවිට,
② ඔබගේ ගෘහය සඳහා වෙනම පිවිසුම් දොරටු, සින්ක් එකක් (මුළුතැන්ගෙයි), වැසිකිළි ආදිය ඇතිවිට. (වෙනත් ගෘහයන් සමග පොදුවේ භාවිතා කලද එම අයගේ ගෘහයන් හරහා නොපිවිසෙන පරිදි ඇත්නම් මෙයට අදාල වේ)

**4 නිවස සාදා ඇති ආකාරය**

**තනි නිවස ..................** මෙය තනි ගොඩනැගිල්ලක් වන අතර, එක් නිවසක් වේ. ගොඩනැගිල්ල වාසස්ථානයක් සහ වාණිජ අවකාශයක් ලෙස භාවිතා කළ ද, මුළු ගොඩනැගිල්ලම තනි වාසස්ථානයක් නම් එය "තනි නිවසක්" ලෙස සැලකේ.

**හවුල් නිවාස ..................** අපාර්ට්මන්ට් එකක් හෝ මන්ෂන් එකක් ලෙස, කොරිඩෝ සහ පඩිපෙළ බෙදා ගනිමින් හෝ එකමත ඒක ඉදිකර ඇති නිවාස දෙකක් හෝ වැඩි ගණනක් සහිත ගොඩනැගිල්ලක් මෙලෙස හැඳින්වේ. මෙයට, පළමු මහල වෙළඳ සැලක් සහ දෙවන මහල සහ ඊට ඉහළ ඒවා නේවාසික ප්‍රදේශ වශයෙන් වන ඒවා ද ඇතුළත් වේ. මෙම අවස්ථාවේ දී, "මුළු ගොඩනැගිල්ලේ ඇති මහල් ගණන" සහ "ඔබ ජීවත් වන නිවස පිහිටා ඇති මහල" ද සඳහන් කල යුතුය.

* පිටතින් සාමාන්‍ය තනි නිවසක් මෙන් පෙනුන ද, පළමු සහ දෙවන මහල් වෙන වෙනම වාසස්ථාන වේ නම්, සහ දෙවන මහලට වෙන් වූ බාහිර පඩිපෙළක් තිබේ නම්, එය "හවුල් නිවාස" ලෙස සැලකේ.

* මහල් නිවාස වර්ගයේ නිවසක (එක් නිවසක් මහල් දෙකකට විහිදෙන වර්ගයේ හවුල් නිවාසයක්), දොරටුව පිහිටා ඇති තට්ටුව "ඔබ ජීවත් වන නිවස පිහිටා ඇති මහල" ලෙස සැලකේ.

* භූගත මහලක් සහිත හවුල් නිවාස සඳහා, කරුණාකර පොළොවෙන් ඉහල මහල් ගණන "මුළු ගොඩනැගිල්ලේ ඇති මහල් ගණන" ලෙස සඳහන් කරන්න. ඔබ භූගතව ජීවත් වන්නේ නම්, කරුණාකර "ඔබ ජීවත් වන මහල" සඳහා "1" ඇතුළත් කරන්න.

**පේළි නිවාස .....................** මෙමගින් නිවාස දෙකක් හෝ වැඩි ගණනක් එකිනෙකට යාබදව ඉදිකර ඇති, පොදු බිත්තියකින් බෙදා වෙන්කරන ලද, පේළි නිවසක් හෝ ටෙරස් නිවසක් වැනි ව්‍යුහයක් අදහස් කරන අතර, සෑම නිවසකටම පිටතට යාමට වෙන වෙනම පිවිසුම් ඇත.

**වෙනත් ..........................** ඉහත කරුණු හැරුණු විට, උදාහරණයක් ලෙස කර්මාන්ත ශාලා හෝ කාර්යාල ආදිය තුළ වාසස්ථාන පිහිටා ඇති අවස්ථා අදහස් කරයි.

## ගෘහයේ සියලුම දෙනා පිළිබඳව
## 5 නම සහ ස්ත්‍රී පුරුෂ භාවය

- වසර 2025 ඔක්තෝබර් 1 වන දින අළුයම 00:00 පෙර ඉපදුන දරුවන්ට තවමත් **නමක් නොතබා** ඇත්නම්, (නම) තුල "නම් නොයෙදූ" ලෙස ලියා ස්ත්‍රී පුරුෂ භාවය සඳහන් කරන්න.

**සාමාන්‍යයෙන් පදිංචි අය** යනු, ඔහුගේ/ ඇයගේ ඒලියන් ලියාපදිංචි කාඩ්පතෙහි (විදේශිකයින් ලියාපදිංචි කර ඇති නේවාසික කාඩ් පතෙහි) සඳහන් ලියාපදිංචි තොරතුරු කුමක් වුවත්, ඔබගේ ගෘහයේ **2025 ඔක්තෝබර් 1 වන දිනට** පදිංචි පහත සඳහන් අය වේ.

- ◆ **දැනටමත් මාස 3 කට වඩා ඔබගේ ගෘහයේ වාසයකරන පුද්ගලයින්**
- ◆ **ඔබගේ නිවසෙහි තවම මාස 3 ක් වාසය නොකරන ලද, එහෙත් මාස 3 කට වඩා වාසය කිරීමට බලාපොරොත්තු වන පුද්ගලයින්**

- ඔබගේ පවුලට අයත් නොවන පුද්ගලයෙකු අවම වශයෙන් මාස 3 ක කාලයක් ඔබගේ ගෘහයේ නැවතී සිටිනම් හෝ නැවතී සිටීමට අදහස් කරන්නේ නම් ඔහු පිළිබඳව ද වාර්තා කරන්න.

- පහත සඳහන් පුද්ගලයින් ඒ ඒ සඳහන් ස්ථාන වලදී සමීක්ෂණයට භාජනය වේ.
  - ➢ මෙය සම්පූර්ණ කරන විට පහත සඳහන් පුද්ගලයින් පිළිබඳව සැලකිලිමත් වන්න.

○ තාවකාලිකව නිවසින් බැහැරව රැකියාවක නිරතවන හෝ සංචාරය කරන අය
......... මාස 3 කට අඩු කාලයක් නිවසින් බැහැරව සිටීනම් එවැනි අය, නිවසේදී සමීක්ෂණයට ඇතුලත් කල යුතුයි.
......... මාස 3 කට වැඩි කාලයක් නිවසින් බැහැරව සිටීනම් එවැනි අය, රැකියා ස්ථානය, සංචාරක ප්‍රදේශය වැනි සිටිනා ස්ථානයන්හිදී සමීක්ෂණයට ඇතුලත් කල යුතුයි.

○ ශිෂ්‍ය නේවාසිකාගාරවල හෝ නවාතැන්පොලවල නැවතී සිටින ශිෂ්‍යයින්
......... නේවාසිකාගාරයේදී හෝ නවාතැන්පොලෙදී සමීක්ෂණයට ඇතුලත් කල යුතුයි.

○ රෝහලක හෝ වෛද්‍ය මධ්‍යස්ථානක නැවතී ප්‍රතිකාර ලබන පුද්ගලයින්
......... රෝහලේ හෝ වෛද්‍ය මධ්‍යස්ථානයේ නැවතී මාස 3 ක් ඉක්මවා නැත්නම් එවැනි අය, නිවසේදී සමීක්ෂණයට ඇතුලත් කල යුතුයි.
......... දැනටමත් මාස 3 කට වැඩි කාලයක් එවැනි ස්ථානයක නැවතී සිටිනම් එවැනි අය, ප්‍රතිකාර ලබන ස්ථානයන්හිදී සමීක්ෂණයට ඇතුලත් කල යුතුයි.

○ නෞකාවක කාර්ය මණ්ඩලයට අයත් පුද්ගලයින්
......... ඔවුන්ගේ නිවස්වලදී සමීක්ෂණයට ඇතුලත් කල යුතුයි.

○ දඬුවම් ලැබ බන්ධනාගාරවල හෝ රැඳවුම් මධ්‍යස්ථානවල සිටින පුද්ගලයින්

○ පුනරුත්ථාපන කඳවුරුවල රඳවා සිටින පුද්ගලයින්
......... රැඳවුම් ස්ථානවල දී සමීක්ෂණයට ඇතුලත් කල යුතුයි.

○ මාස 3 කට වඩා කාලයක් වාසය කරනලද ස්ථිර ස්ථානයක් හෝ වාසය කිරීමට යාහැකි ස්ථානයක් හෝ නොමැති අය
......... දැනට සිටින ස්ථානයේ දී සංගණනයට ඇතුලත් කල යුතුයි.

○ ස්ථාන දෙකක වාසය කරන පුද්ගලයින්

......... වැඩි දින ප්‍රමාණයක් ගත කරන ස්ථානයේදී සමීක්ෂණයට ඇතුලත් කල යුතුයි.

## 6 ගෘහමූලිකයා අතර ඇති සම්බන්ධතාවය

නිවසේ එක් අයෙක් "ගෘහ මූලිකයා හෝ එම නිවසේ නියෝජිතයා" ලෙස තෝරාගන්න.

ගෘහයේ සිටින අනෙක් සාමාජිකයින් "ගෘහ මූලිකයාට හෝ නියෝජිතයාට" ඇති ඥාතීත්වය සඳහන් කරන්න.

**වෙනත් ඥාතීන්...** මීමුත්තා මීමිත්තනිය, මුනුබුරාගේ/මිනිබිරියගේ දරුවා, මාමා, නැන්දා, නැනා, මස්සිනා හෝ ඥාති සහෝදර සහෝදරියන් (ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් හෝ භාර්යයාවන් අයත්) මේ යටතට අයත් වේ.

**වෙනත් ............** ඥාතී නොවන නිවසේ රැඳීසිටින පුද්ගලයින් මේ යටතට අයත් වේ. මිතුරන්ගේ දරුවන් රැකබලා ගන්නේනම් ඔවුන්. (එකට ජීවත්වන සේවකයින් මේ යටතට අයත් නොවේ.)

## 9 ජාතිය

ජපානයේ පුරවැසිබව ඇතුලුව බහු පුරවැසිබව හිමි අය ජපානයේ පුරවැසියෙකු ලෙස සැලකිය යුතුයි.

ජපානයේ පුරවැසිබව නැතිව බහු පුරවැසිබව හිමි අය, ඉන් එක් රටක නම (රටේ නම) තුළ සඳහන් කරන්න.

## 10 වර්තමාන ස්ථානයේ වාසය කරන ලද කාලය

මෙතැන ජීවත් වීමට පටන්ගත් පසු, රැකියා ස්ථානයේ මාරුවක් නිසා, නිවසින් බැහැරව වැඩකිරීමෙන්, සංචාර, ව්‍යාපාර සංචාර හේතුවෙන් තුන් මසකට වැඩි කාලයක් නිවසෙන් බැහැරව සිටියේ නම්, එවැනි අය කාලය ගනන් ගැනීමේ දී, දැනට පදිංචි ස්ථානයට නැවත පැමිණි දින සිට මේ දක්වා කාලය සැලකිල්ලට ගන්න.

## 11 වසර 5 කට පෙර (2020 ඔක්තෝබර් 1) වාසය කල ස්ථානය

වසර 5කට පෙර (එනම් 2020-10-01 දින) වාසය කල සථානය සඳහන් කරන්න.。

- 2025-10-1 දිනට, දැනට රෝහල හැර නොගොස් සිටින අලුතින් උපත ලද දරුවකු සිටී නම්, රෝහල හැරගිය පසු වාසය කරන ස්ථානය සඳහන් කරන්න.
- පහත සඳහන් වන්නේ ටෝකියෝ නගරයහි කොට්ඨාශ 23 යි.

චියෝද්-කු, චුඕ-කු, මිනතො-කු, ෂින්ජුකු-කු, බුන්ක්යෝ-කු, තයිතො-කු, සුමිද-කු කොතො-කු, ෂිනගවා-කු, මෙගුරො-කු, ඕතා-කු, සෙතගයා-කු, ෂිබුයා-කු, නකානො-කු, සුගිනමි-කු, තොෂිමා-කු, කිතා-කු, අරකවා-කු, ඉතබෂි-කු, නෙරිමා-කු, අදචි-කු, කත්සුෂිකා-කු, එදොගවා-කු

**සමීක්ෂණ පත්‍රිකාවේ දෙවන පිටුව සම්පූර්ණ කරන ආකාරය**

### ගෘහයේ සියලු පුද්ගලයින් පිළිබඳව
### 12 2025 සැප්තැම්බර් 24 සිට 30 දක්වා සතිය තුල ඔබ වෘත්තියක නියලුනේ ද?

සැප්තැම්බර් 24 සිට 30 අතර සතියක කාල පරිච්ඡේදය තුල ඔබ රැකියාවක සුළු වශයෙන් හෝ නිරත වූයේ නම්, ඉහල කොටසෙන්ද, කොහෙත්ම රැකියාවක් නොකළ අය පහල කොටසෙන්ද ගැලපෙන එකක් පමණක් තෝරා සලකුණු කරන්න.

“ප්‍රවීණත්ව පුහුණුව” සඳහා නේවාසික තත්වය ලබා ඇති අයගෙන්, තවමත් පුහුණු කාල සීමාව තුළ සිටින අය “පාසල් යාම” කොටසෙහි ලකුණු කළ යුතුය.

**නිවසේ කටයුතු වැනිදේ කිරීම** ........ ප්‍රධාන ලෙස ගෙදරදොර කටයුතුවල නියලෙමින් ඉතා කෙටි කලකට හෝ වැටුප් ලබන රැකියාවල නිරත අය (උදා. අර්ධකාලීන රැකියාවල නිරත අය, පවුලේ ව්‍යාපාරවලට උදව් වන අය, කෑලි ගණනට වැඩකරන අය)

**නිවාඩුගෙන සිටියා** ........ **කිසියම් වෘතියක නියැලුන පුද්ගලයෙකු** අසනීප වී හෝ නිවාඩුගෙන සිටියද වැටුප් ලබන්නන් ලෙස සිටින අය, වෘතීයමය රක්ෂණ නීතිය යටතේ ළදරු සුරැකුම් නිවාඩු ප්‍රතිලාභ ලබන අය, **තමාගේ ව්‍යාපාරයක් කරගෙන යන අය** රෝග විවේක ආදිය නිසා නිවාඩුගෙන මාස 3 ක් ගතවී නොමැති විට

**රැකියාවක් සොයමින් සිටියා** ........ රැකියාවක් නොමැතිව හෙලෝ වර්ක් වැනි රැකියා නියෝජිත ආයතන මගින්, පත්තර ආදියෙහි පලවන ඇබෑර්තු තුලින්, අඳුනන අය මගින්, ඕනෑකමින් රැකියාවක් සොයමින් සිටින අය.
එවැනි අය රැකියාවක් හමුවන අවස්ථාවේදී එම රැකියාවෙහි නියලීමට සූදානමින් සිටින අය විය යුතුය.

**පාසල් යාම** ........ ජපන් භාෂා පන්ති සූපශාස්ත්‍ර පන්ති ආදී සතියකට වරක් දෙවරක් සහභාගීවන අක්‍රමවත් පංති ඇතුලත් නොවේ.

- ➢ දිවාසුරැකුම් මධ්‍යස්ථාන, ළදරු පාසල් හෝ දිවා සුරුකුම් හා ළදරු පාසල් ඒකාබද්ධ මධ්‍යස්ථාන ආදියට ඇතුලත්කර ඇති දරුවන් “වෙනත්” යන කොටසට අයත් වේ.

### වැඩ කරන/ පාසල් යන පුද්ගලයින් පිළිබඳව
### 13 රැකියාව කරන හෝ අධ්‍යාපනය ලබන ස්ථානය

- ● පාසල් යාම හා වෘතියක නියලීම යන දෙකෙහිම නියැලෙන පුද්ගලයින් වෘතිය සිදුකරන ස්ථානය සටහන් කරන්න.
  - ➢ ටෝකියෝ නගරයෙහි කොට්ඨාශ පිළිබඳව 5 පිටුවේ “11 හි, වසර 5 කට පෙර (2020 ඔක්තෝබර් 1) වාසය කල ස්ථානය” උපයෝගි කරගනිමින් වටහාගත හැක.

- ● පහත සඳහන් පුද්ගලයින් ඒ ඒ සඳහන් ස්ථානය රැකියා ස්ථානය ලෙස සලකුණු කරන්න.
  - ○ තමන්ගේ ගොවිපොලේ, කඳු භූමියේ, මසුන් අල්ලන බෝට්ටුවේ වැඩකරන්නන් ...... නිවස
  - ○ තමන්ගේම වඩු වැඩපලක් කරන්නන්, බඩු විකුණමින් යන්නන් ............................... නිවස
  - ○ වෙනත් සේවාස්ථානයක වෘතියේ යෙදී සිටින පුදගලයින් (බාහිර සේවකයන් රියදුරන් ආදිය) ................. සේවා ස්ථානය අයත් ප්‍රදේශය
  - ○ නෞකාවන්හි සේවයේ යෙදී සිටින පුද්ගලයින් .................... එම නෞකාව ප්‍රධාන වශයෙන් නැංගුරම්ලා ඇති ප්‍රදේශය

### වෘතියක නියැලෙන පුද්ගලයින් පිළිබඳව
### 14 ආයතනයක රැකියාවක නිරත වන්නේද, ස්වයං ව්‍යාපාරයක් කරන්නේද යන වග

**ආයතනයක වැඩ කරන පුද්ගලයින්...** සමාගම්, සංවිධාන, රජයේ කාර්යාල සහ වෙනත් ව්‍යාපාර ස්ථාන ආදියෙහි සේවයේ යොදවා සිටින්නන්.

* **තාවකාලික සේවක...** තාවකාලික සේවක (තාවකාලික රැකියා නියෝජිත ආයතන විසින් සේවයේ යොදවා සිටින්නන්), සේවා ස්ථානයේදී “පාතො

සන්, අරුබයිතො සන්", ආදී විවිධ නම් වලින් හැඳින් වුවද ඔවුන් "තාවකාලික සේවක" ලෙස සැලකේ.

**සමාගමේ අධ්‍යක්ෂ/විධායක ...** සභාපති, අධ්‍යක්ෂක, විගණන නිලධාරී මණ්ඩලය, සමාජ සේවා ආදියෙහි පරීක්ෂක යන වෘත්තිකයන්.

➢ කළමණාකරු, උප සභාපති, සහය කළමණාකරු යන ශ්‍රේණිවල අය, විධායක අධ්‍යක්ෂක, අංශ ප්‍රධානී නිල නොදරන්නේ නම් එම අයද "ආයතනයක වැඩ කරන පුද්ගලයින්" ඝණයට අයත්වේ.

**තම ව්‍යාපාර පවත්වාගෙන යන්නන්............** සේවා නියුක්තිකයින් යොදවා සිටී නම් "සේවකයින් ඇත" ලෙස සඳහන් කරන්න සේවා නියුක්තිකයින් යොදවා නොසිටීනම් "සේවකයින් නැත" ලෙස සඳහන් කරන්න.

➢ ව්‍යාපාර අලෙවිසැල් පවත්වාගෙන යන්නන් එම ව්‍යාපාරය සමාගමක් ආකාරයෙන් (සීමා සහිත රහිත) පවතීනම් "සමාගම් නිලධාරී" කොටසට අයත්වේ.

**පවුලේ සාමාජික සේවකයින් .........** ගොවිපොලවල් පුද්ගලික වෙළඳසැල් ආදියෙහි කෘෂිකාර්මික සහයක ලෙස කටයුතු කරන පුද්ගලයින්.

**අමතර ආදායම්/ ස්වයං රැකියා ..................** අමුද්‍රව්‍ය සපයාගෙන විශාල ප්‍රමාණයේ යන්ත්‍ර භාවිතා නොකර තමාම වෘත්තියක නියලීම.

## 15 රැකියා ස්ථානයේ නම

- තමා සේවය කරන සේවා සථානයේ (මූලස්ථානය, ශාඛාව, කාරයාලය, කර්මාන්ත ශාලාව, අලෙවිසැල ආදියේ) නම සඳහන් කරන්න.
  - **ශාඛා කාරයාල ආදියේ සේවය කරන අය**, සමාගමේ නම පමණක් නොව, තමා සේවයකරන ශාඛාවේ හෝ කාරයාලයේ නම ද සඳහන් කරන්න.
  - **ස්ථාන දෙකක් හෝ ඊට වඩා කීපයක සේවය කරන අය**, තමා වැඩි වෙලාවක් සේවය කරන ස්ථානය සඳහන් කරන්න.
  - **ඔබ තාවකාලික රැකියා නියෝජිත ආයතනයක් මඟින් සේවයේ යොදවා ඇත්නම්**, එම ආයතනය මඟින් ඔබ සේවයේ යොදවා ඇති **වැඩ කරන ස්ථානය** නම් කරන්න.

## 15 කර්මාන්තයේ ස්වභාවය

- රැකියාව කරන ආයතනයහිදි **ප්‍රධාන වශයෙන් නිරත වන කටයුත්ත** නම් කරන්න.
- එම ආයතනයේ ප්‍රධාන නිෂ්පාදන හා සේවාවන්ද, එහි දී නිෂ්පාදනය කරන්නේ ද අළුත්වැඩියා කරන්නේ ද යන වග, තොග විකුණන්නේද සිල්ලරට විකුණන්නේද යන වග පැහැදිලිව සඳහන් කරන්න.
  - **එම ආයතනය තුල කර්මාන්ත කටයුතු දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක නිරත වන්නේ නම්** ප්‍රධාන කටයුත්ත පමණක් සඳහන් කරන්න.
  - **නිෂ්පාදනය කල භාණ්ඩ එම ස්ථානයේම පාරිභෝගිකයන්ට අලෙවි කරන්නේ නම්** "○○ නිෂ්පාදක / සිල්ල වෙළන්දා" ලෙස සඳහන් කරන්න.(○○ වෙනුවට නිෂ්පාදනයේ නම සඳහන් කරන්න.)
  - **ඔබ තාවකාලික රැකියා නියෝජිත (හකෙන්) ආයතනයක් මඟින් සේවයේ යොදවා ඇත්නම්**, එම ආයතනය මඟින් ඔබ සේවයේ යොදවා ඇති **වැඩ කරන ස්ථානයේ** කෙරෙන කර්මාන්ත කටයුත්ත සඳහන් කරන්න.

## 16 රැකියාවේ ස්වභාවය

○ එම වැඩ කරන සේවාස්ථානයේ **ඔබව ප්‍රධාන වශයෙන් යොදවා ඇති ව්‍යාපාර කටයුත්ත** විස්තර කරන්න.

○ "මූල්‍ය විශ්ලේෂක", "ජාත්‍යන්තර නීතිඥ", "ඩිසයිනර්" ආදී ලෙස ඔබගේ **රැකියාවට වෙනම තනතුරු නමක් ඇත්නම්** එය සඳහන් කරන්න.

○ **කාර්යයන් කීපයක යෙදී සිටී නම්**, ඒ අතරින් වැඩිම කාලයක් යොදවන කාර්යයේ අන්තර්ගතය සඳහන් කරන්න.

- **වෙළඳාම්, කලමණාකරණ යන කාර්යයන්ට අමතරව ආහාර පිසීම, නිෂ්පාදන අලුත්වැඩියා වැනි තාක්ෂණික හා ශිල්පීය කාර්යයන් හි නිරතව සිටින අය** එම තාක්ෂණික හා ශිල්පීය කාර්යය සඳහන් කරන්න.

  උදා: නීති ආයතනයක කලමණාකරණය කරමින් නීතිඥයකු ලෙස වැඩ කිරීම ……. නීතිඥ ආපනශාලාවක කලමණාකරණය කරමින් අරක්කැමියකු ලෙස වැඩ කිරීම …………… අරක්කැමි

○ **ඔබ තාවකාලික රැකියා නියෝජිත (හකෙන්) ආයතනයක් විසින් සේවයේ යොදවා ඇත්නම්**, එමඟින් ඔබ සේවයේ යොදවා ඇති **වැඩ කරන ස්ථානයේ** ඔබට පවරා ඇති කාර්යයේ අන්තර්ගතය සඳහන් කරන්න.

## 15 හා 16 හි උදාහරණ

〔උදා１〕නිෂ්පාදන කර්මාන්තය

| | | |
|---|---|---|
| 15 තීරුව | සේවා ස්ථානයේ නම | සීමා සහිත අවොසොරා රථවාහන සමාගම කර්මාන්ත ශාලා අංක 1 |
| | කර්මාන්තයේ ස්වභාවය | ගියර් පද්ධති නිපැයුම |
| 16 තීරුව | රැකියාවේ ස්වභාවය | ගියර් පද්ධති එකලස් කිරීම |

〔උදා２〕සේවා කර්මාන්තය

| | | |
|---|---|---|
| 15 තීරුව | සේවා ස්ථානයේ නම | සීමාසහිත ටෝටල් කෙයා සෙන්ටර් |
| | කර්මාන්තයේ ස්වභාවය | මහලුවියට පත් අයගේ නිවාසවලට ගොස් ස්නානය, ආහාර ගැනීම ආදියට ඔවුන්ට උදවු කිරීම |
| 16 තීරුව | රැකියාවේ ස්වභාවය | නිවාස උපස්ථායක/ උදවුකරු |

〔උදා３〕තොග වෙළඳාම

| | | |
|---|---|---|
| 15 තීරුව | සේවා ස්ථානයේ නම | සීමාසහිත රිකා ට්‍රේඩින් සමාගම |
| | කර්මාන්තයේ ස්වභාවය | ආනයනික මධ්‍යසාර තොග අලවිය |
| 16 තීරුව | රැකියාවේ ස්වභාවය | භාණ්ඩ මිලට ගැනීම |